# සර්වපාක්ෂික නියෝජිත කමිටු වාර්තාව

පසුගිය සතියේ දේශපාලන කරළියේ කතාබහට ලක් වූ සර්වපාක්ෂික නියෝජිත කමිටු වාර්තාව බදාදා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට භාරදෙනු ලැබිණි. ඒ නිමිත්තෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවති හමුවට මෙරට බොහෝ දේශපාලන පක්ෂවල නායකයෝ සහභාගි වූහ. ඒ අතර පාර්ලිමේන්තු නියෝජනයක් ඇති පක්ෂ මෙන් ම එවැනි නියෝජනයක් නැති පක්ෂ ද විය. එයට සහභාගි නොවූ පක්ෂ අතර එ වි ප (එක්සත් ජාතික පක්ෂය නමින් පෙනී සිටින එක්සත් විජාතික පක්ෂය), කොටි සංවිධානය වෙනුවෙන් පාර්ලිමේන්තුවේ පෙනී සිටින දෙමළ ජාතික සංධානය, රවුෆ් හකීම් මහතාගේ නායකත්වයෙන් වූ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය, තොණ්ඩමන් මහතාගේ නායකත්වයෙන් වූ ලංකා කම්කරු කොංග්‍රසය හා ජනතා විමුක්ති පෙරමුණ විය.

වාර්තාවේ අඩංගුවන්නේ ප්‍රධාන යෝජනා තුනක් පමණකි. පළමුවැන්න දැනට නීතිය බවට පත්වී ඇති දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් අදාළ කරුණු ක්‍රියාත්මක කළ යුතු වේ යන්න ය. ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සැපයීම ද එයට ඇතුළත් ය. දෙවැනි යෝජනාවෙන් කියැවෙන්නේ නැගෙනහිර පළාතේ පළාත්සභාවට ප්‍රජාතන්ත්‍රවාදී ව මන්ත්‍රීවරුන් තෝරාපත්කර ගැනීම සඳහා වහාම මැතිවරණයක් පැවැත්විය යුතු බව ය. තුන්වැන්නෙන් උතුරු පළාතේ මැතිවරණ පැවැත්වීමට සුදුසු වාතාවරණයක් සකස්වන තුරු ඒ පළාත සඳහා දේශපාලන නියෝජනත්වයක් සහිත අන්තර්කාලීන මණ්ඩලයක් පත්කළ යුතු යැයි යෝජනා කෙරෙයි.

පළමුවැනි යෝජනා දෙක විවාදාත්මක වේ යැයි සිතිය නො හැකි ය. ඒ යෝජනා දෙක ම කෙරෙන්නේ සෘජුව ම පවත්නා නීතියට යටත් ව ය. පළාත් සභා ව්‍යවත්ථාවේ සඳහන් ආකාරයට ක්‍රියාත්මක විය යුතු ය යන්න ඒ යෝජනාවල හරය වෙයි. ඉන්දියාවේ මැදිහත්වීමෙන් පළාත් සභා ස්ථාපිත කිරීම සඳහා දහතුන් වැනි ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී ශ්‍රී ල නි ප, ජ වි පෙ, ම එ පෙ මෙන් ම වත්මන් ජාතික හෙළ උරුමයේ නායකයෝ ද එයට විරුද්ධ වූහ. එහෙත් ව්‍යවස්ථා සංශෝධනය පවත්නා ව්‍යවස්ථාවට එකඟ ව පාර්ලිමේන්තුවේ සම්මත විය. අප කැමති වුවත් නැතත් දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය අද රටේ ව්‍යවස්ථාවේ කොටසකි. එනම් ඒ රටේ උත්තරීතර නීතියේ කොටසකි. ඒ අතර ඒ ව්‍යවස්ථාවේ ඇතැම් වගන්ති පසුව සම්මත වූ ව්‍යවස්ථා සංශෝධන මගින් අවලංගු කෙරී ඇත. මෙරට ව්‍යවස්ථා සංශෝධන ද කෙරෙන්නේ අනෙක් කටයුතු කෙරෙන පරිද්දෙනි. එහි දී කල්වේලා ගෙන නිසි අධ්‍යයනයක් නො කෙරෙයි. ඒ කෙසේ වෙතත් ජාතික පොලිස් කොමිසම හා පළාත් පොලිස් කොමිසම් පිහිටුවීමෙහි ලා පරස්පර ඇත. ඒ සියල්ල කවදා හෝ නිසි දර්ශනයක් සහිත ව විධිමත් කළ යුතු වෙයි. ඒ සඳහා ව්‍යවස්ථා සංශෝධන අවශ්‍ය වෙයි. එහෙත් අද පාර්ලිමේන්තුවේ බලතුලනය අනුව ව්‍යස්ථා සංශෝධනයක් කිරීම සඳහා තුනෙන් දෙකේ වැඩි ඡන්දයක් ලබාගැනීම දුෂ්කර කාර්යයක් වෙයි.

පසුව සම්මත වූ ව්‍යවස්ථා සංශෝධනවලට අනුව පළාත් පොලිස් කොමිසන් සභා දේශපාලනීකරණයට භාජනය වී ඇත. ඒ පොලිස් කොමිසම් සභාවල පළාත් සභාවේ මහ ඇමතිවරයා නම් කරන තැනැත්තෙක් වෙයි. ඒ අනුව පළාත් පොලිස් කොමිසනි සභාව දේශපාලනීකරණය වී ඇත. එහෙත් ජාතික පොලිස් කොමිසම් සභාවෙහි ජනාධිපතිතුමා නම්කරන සාමාජිකයකු නැත. ජාතික පොලිස් කොමිසම නිර්දේශපාලනීකරණය වී ඇති මුත් පළාත් පොලිස් කොමිසම් සභා දේශපාලනීකරණයට ලක් වී ඇත. එබැවින් පළාත් පොලිස් කොමිසම් සභා පිහිටුවීමෙහි ලා ආණ්ඩුවට ප්‍රශ්න ඇති බව පමණක් දැනට සඳහන් කළ යුතු ය. එසේ වුවත් පළාත් පොලිස් කොමිසම් සභා නැතිව වුවත් ආණ්ඩුවට අවශ්‍ය පරිදි දෙමළ කතාකරන පොලිස් නිලධාරීන් පත්කිරීමට හැකි ය. දෙමළ කතාකරන යන්නට දෙමළ පොලිස් නිලධාරීන් පමණක් නොව දෙමළ කතාකරන මුස්ලිම් හා සිංහල නිලධාරීන් ද අයත්වන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. දෙමළ කතාකරන ජනතාව යන්නට ඒ ඒ අය විවිධ දේශපාලන අර්ථකථන දී ඇත. ඒ පිළිගැනීමට අනෙක් අය බැඳී නැත. කෙසේ වුවත් දෙමළ කතාකරන පොලිස් නිලධාරීන් යන්නට දේශපාලන අර්ථකථනයක් නැත. දෙමළ කතාකරන පොලිස් නිලධාරීහු යනු වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම දෙමළ කතාකරන නිලධාරීහු වෙති. ඇතැම් නිලධාරීන් සිංහල මෙන් ම දෙමළ ද කතාකරන නිලධාරීන් විය හැකි ය.
රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පිහිටුවා ඇති ඇතැම් ආයතන කෙසේ සිතුවත් සියළු සිංහලයන්ට දෙමළ ඉගෙන ගැනීම අනිවාර්ය විය යුතු නැත. එහෙත් රාජ්‍ය සේවයට බැඳෙන ඇතැම් සිංහලයන් ද දෙමළ ඉගෙන

© Prof. Nalin De Silva

ගැනීමේ වැදගත් කමක් ඇත. රටේ විශාල බහුතරය සිංහල බැවින් රාජ්‍ය සේවයට බැඳෙන දෙමළ ජනයා වැඩි පිරිසක් සිංහල දැනගෙන සිටීම අනිවාර්ය වනු ඇත. මේ පිළිබඳ තීරණ ගැනීමේ දී සියල්ලන් සමාන ය ආදී වියුක්ත සටන්පාඨ මත පදනම් වීම නැති ගැටළු ඇතිකරන්නක් පමණක් වෙයි. පුද්ගලයන් සමාන වන නමුත් ජාතීන් සංස්කෘතීන් සමාන නැත. ජනගහනයෙන් සියයට හැත්තෑපහක් පමණ වන්නාවූ ද මෙරට අවුරුදු දහස් ගණනක් තිස්සේ අනන්‍ය සංස්කෘතියක් ගොඩ නැගුවා වූ ද සිංහලයන්ට හිමි තැන අහිමිකිරීමට බටහිරයන් ගේ ආශිර්වාදය මත විවිධ අය උත්සාහ දැරීම මෙරට ඇති ප්‍රධාන ප්‍රශ්නය වෙයි. එහෙත් සිංහලයන් ස්වේච්ඡාවෙන් දෙමළ ඉගෙනගැනීමේ වැදගත්කමක් ඇති බව අවධාරණය කළ යුතු ය. සර්වපාක්ෂික නියෝජිත කමිටු අතුරු වාර්තාවේ සිංහල ජනයා දෙමළ ඉගෙනගැනීම සම්බන්ධයෙන් හෝ දෙමළ ජනයා සිංහල ඉගෙනගැනීම සම්බන්ධයෙන් හෝ කිසිවක් සඳහන් නො වේ. ඉහත සඳහන් කරුණු හුදෙක් ජනතාව දැනුම්වත්කිරීම සඳහා ය.

නැගෙනහිර පළාතේ දැනටමත් පළාත් පාලන ආයතනවල නිලවරණ පැවැත්වීමට පියවර ගනු ලැබ ඇත. එහි ව්‍යවස්ථාවෙහි සඳහන් දරිදි පළාත්සභා ප්‍රජාතන්ත්‍රවාදීව ස්ථාපිත කිරීම ඒ පළාතට මෙන් ම රටට ද වැඩදායක වෙයි. කොටි සංවිධානයේ ෆැසිස්ට් හස්තය යටතේ සිටි ජනතාවකට නිදහස ලබා දී ඔවුන්ට තම කටයුතු කරගෙන යෑමට ඉඩ දීමට කිසිවකුට හෝ විරුද්ධ විය හැකි යැයි සිතිය නො හැකි ය. එහෙත් ප්‍රශ්නයක් මතුවිය හැක්කේ උතුරු පළාත සම්බන්ධයෙන් කමිටුව විසින් ඉදිරිපත් කෙරී ඇති යෝජනාව සම්බන්ධයෙනි.

උතුරු පළාතේ දැනට පළාත්සභා මැතිවරණයක් පැවැත්වීමට තරම් වාතාවරණයක් නැති බැවින්, එලෙස මැතිවරණයක් පැවැත්වීමට සුදුසු තත්වයක් ඇතිවන තුරු අන්තර්කාලීන මණ්ඩලයක් පිහිටුවිය යුතු බව කමිටුවේ යෝජනාව වෙයි. මෙවැනි මණ්ඩලයක් පිහිටුවීමෙන් උතුරු පළාතේ වාසය කරන ජනතාවට අසාධාරණයක් නො සිදුවෙයි. මණ්ඩලයේ දේශපාලන නියෝජනත්වයක් තිබිය යුතු ය යන්න සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ අදහස වෙයි. උතුරු පළාතේ ජනතාවට කොටි සංවිධානය නිසා පසුගිය දශක දෙකකට අධික කාලයක් තිස්සේ දේශපාලන නායකත්වයක් තිබී නැත. කොටි සංවිධානය තම දේශපාලනය උතුරු පළාතේ ජනතාව මත බලහත්කාරයෙන් පැටවීම ඒ ජනතාවට සපයන දොශපාලන නායකත්වයක් නො වෙයි.

ආණ්ඩුවේ මැදිහත්වීමෙන් උතුරු පළාතේ ජනතාවට නිලධාරි තන්ත්‍රය ඔස්සේ තම ප්‍රශ්න යම් ප්‍රමාණයක් විසඳාගැනීමට හැකි වී ඇත. එහෙත් ඒ ප්‍රමාණවත් නො වෙයි. අනෙක් පළාත්වල ජනතාවට තම ප්‍රශ්න විසඳාගැනීමට දේශපාලන නායකයන් මැදිහත් කරවාගැනීමට හැකි වුවත් උතුරු පළාතේ ජනතාවට ඒ වරම නැත. උතුරු පළාතට අන්තර් කාලීන මණ්ඩලයක් පත්කිරීමෙන් බලාපොරොත්තුවන්නේ ඔවුන්ට ද ඒ දේශපාලන මැදිහත්වීම ලබාදීම ය. එබැවින් ම ඒ මණ්ඩලයට හුදු නිලධාරීන් පිරිසක් පත්නොකරනු ඇතැයි සර්වපාක්ෂික නියෝජිත කමිටුව බලාපොරොත්තු වෙයි. එහෙත් අන්තර්කාලීන මණ්ඩලය ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවේ අධීක්ෂණය යටතේ පිහිටුවීම වැදගත් වෙයි. අන්තඃකාලීන මණ්ඩලය පිහිටුවීමට යෝජනාකෙරී ඇත්තේ ජනාධිපතිතුමා විසින් නිකුත් කෙරෙන ආඥාවක් යටතේ ය. ඒ ආඥාව සුදුසු පරිදි නිකුත් කිරීමෙන් මණ්ඩලයට සිදු කෙරෙන විදේශීය බලපෑම්, ඒ සමග ඇතිකරන විදේශීය සම්බන්ධතා ආදිය මුළුමනින්ම නැවැත්වීමට වග බලාගත යුතු ය. මෙහි දී ඉන්දු ලංකා ගිවිසුම යටතේ ඉන්දියාවෙන් ඊනියා සාම සාධක හමුදාවක් එවීම අපේ සැලකිල්ලට ගත යුතු ය.

සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ මේ යෝජනාවට කොටි සංවිධානය හෝ ඔවුන්ට වක්‍රව ආධාර කරන කිසිම පක්ෂයක් හෝ සංවිධානයක් හෝ පක්ෂ වේ යැයි සිතිය නො හැකි ය. කොටි සංවිධානයේ පාර්ලිමේන්තු නියෝජිතයන් වූ දෙමළ ජාතික සංවිධානය ද ඒ යෝජනාවට විරුද්ධ වනු ඇත. එයට ප්‍රධාන හේතුව ඒ යෝජනාව ක්‍රියාත්මක වීම කොටි සංවිධානයේ බලය බිඳීමට හේතු වීම ය. අද කොටි සංවිධානයට එරෙහිව ආණ්ඩුවේ මානුෂික මෙහෙයුම් ක්‍රියාත්මක වෙයි. හමුදාමය වශයෙන් ඒ ක්‍රියාමාර්ගය තව තවත් දැඩිව ඉදිරියට යා යුතු වෙයි. එහෙත් ඒ අතර උතුරු පළාතේ හිදිමින් ම ක්‍රියාත්මක වන දේශපාලන ක්‍රියාදාමයක් ද අවශ්‍ය වෙයි. අන්තර්කාලීන මණ්ඩලය මගින් ඒ දේශපාලන ක්‍රියාදාමය සාක්ෂාත් වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. කොටි මුළුමනින් පරදවා සුදුසු වාතාවරණයක් සකස්කිරීමෙන් පසුව මැතිවරණයකින් පත්කෙරෙන පළාත්සභාවකට ඉඩ දී මණ්ඩලය විසුරුවා හැරිය යුතු වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva